( 17 )

# ප්‍රිමාටාවන්ගෙන් නිරූපිත මානව ලක්ෂණ හා සමගාමී ජෛවීය ලක්ෂණ (ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාල භූමියේ සිටින හැලි වඳුරු කණ්ඩායමක් පිළිබඳ කළ අධ්‍යයනයක් ඇසුරින්)

මනෝෂා නිරංජලී රත්නායක
සිව්වන වසර
manoshirathnayaka@gmail.com

## හැඳින්වීම

විශ්වයේ අපූර්වතම ම නිර්මාණය මිනිසා ය. ලොව ඥානවන්ත ම සත්ත්වයා වන මොහු පිළිබඳ සොයා බැලීම සෑම මානව සමාජයක ම දක්නට ලැබෙන ආශයකි. ආදි මිනිසා බිහි වූයේ කවදා ද? මිනිසාගේ ගමන් මඟ හැඩ ගැසුණේ කෙසේ ද? මානව වර්ධනයේ අවසානය කොතැන ද? ආදී වශයෙන් මිනිසා පිළිබඳ ව සොයා බැලීම්, ප්‍රශ්න කිරීම් හා පැහැදිලි කිරීම් එක ම විෂය ක්ෂේත්‍රයකට ඇතුළු කර පොදුවේ මිනිසා ගැන අධ්‍යයනය කිරීම මානවවිද්‍යාව නම් වේ. එනම් මානවවිද්‍යාව මිනිස් ජීවියාගේ සමස්ත ජීවිතය ම විද්‍යාත්මක ව අධ්‍යයනය කරන විෂයක් වේ.

මානවවිද්‍යා විෂය ක්ෂේත්‍රය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වයි. එනම්,

- භෞතික මානවවිද්‍යාව (Physical Anthropology)
- සංස්කෘතික මානවවිද්‍යාව (Cultural Anthropology)

භෞතික මානවවිද්‍යාවේ උප විෂයක් වූ ප්‍රිමාටා විද්‍යාව තුළ ප්‍රිමාටා සත්ත්වයන් පිළිබඳ අධ්‍යයනය කරයි. මෙහි දී මිනිසාගේ අතීතය පිළිබඳ සිත්තම අඳින විට මිනිසාට සමීපත ම ක්ෂරපායි ගණයේ සතුන් වන වඳුරන්, රිළවුන් ආදි ප්‍රිමාටා වර්ගයේ සතුන්ගේ ජෛවීය ලක්ෂණ වැදගත් වේ. නූතන අග්‍රේෂයන් සහ මානවයා අතර ඇති කායික සහ චර්යාත්මක ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරමින් මානව පූර්වජයන් පිළිබඳ අධ්‍යයනයට විද්‍යාඥයන් පෙළඹී ඇත.

## ප්‍රිමාට අධ්‍යයනයේ වැදගත්කම

ප්‍රිමාට සත්ත්වයන් අධ්‍යයනය කරන විෂය ක්ෂේත්‍රය ප්‍රිමාටා විද්‍යාව (primatology) ලෙස හඳුන්වන අතර ඔවුන් සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකරන විද්‍යාඥයෝ ප්‍රිමාටා විද්‍යාඥයින් (primatologists) ලෙස හඳුන්වයි. ප්‍රිමාටාවන් මීට වසර මිලියන 65කට පමණ පෙර පෘථිවියේ පහළ වී නොයෙකුත් පරිණාමික ක්‍රියාවලීන්ට භාජනය වීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රිමාටා විශේෂ 250-300 අතර ප්‍රමාණයක් ලොව පුරා ව්‍යාප්ත ව ඇත. ඔවුන් වැඩිපුර ම නිවර්තන හා උප නිවර්තන රටවල් ආශ්‍රිතව දක්නට ලැබේ (ගුණවර්ධන සහ අදිකාරි; 2009; 142).

ප්‍රිමාටාවන්ගේ අධ්‍යයන පරාසය තුළ විද්‍යාඥයින් ප්‍රධාන කරුණු කිහිපයක් අරඹයා ඔවුන් පිළිබඳ අධ්‍යයනයන් දියත් කරයි. එනම්,

මිනිසා සහ අනෙකුත් ප්‍රිමාටාවන් අතර ඇති සමීප ඥාතිත්වය ( Kin relatioìhip) හේතුවෙන් විද්‍යාඥයින් මොවුන් පිළිබඳ අධ්‍යයනය කරයි. ප්‍රිමාටාවන් සහ මිනිසා එක ම ආදි වාසියෙකුගෙන් පැවත ආ බවට විද්‍යාඥයින් තහවුරු කරගෙන ඇති අතර මානවයා සහ ප්‍රිමාටාවන් තුළ සමීප ලක්ෂණ බොහෝමයක් දැකිය හැකි වේ. දැනට ජිවත් වන මිනිස් නොවන ප්‍රිමාටාවන්ගේ භෝජන ක්‍රම, සමාජ චර්යා රටා සහ ව්‍යුහ විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීමෙන් ආදි මානවයාගේ චර්යා රටාවන් නැවත ගොඩනගා ගැනීමට නැතහොත් මිනිස් නොවන ප්‍රිමාටාවන් අධ්‍යයනයෙන් මිනිසාගේ පරිණාමීය පසුබිම පිළිබඳ අවබෝධ කර ගැනීමට විද්‍යාඥයින් යොමු වි තිබේ.

එමෙන් ම මිනිසා අනෙකුත් ප්‍රිමාටාවන්ගෙන් වෙන් වු පසු ස්වභාවික වරණය (Natural selection) සහ ලිංගික වරණය (Sexual selection) ප්‍රිමාටාවන්ගේ පරිණාමික ක්‍රියාවලියේ දී කෙසේ බලපෑවේ ද? යන්න දැන ගැනීමට විද්‍යාඥයෝ බලාපොරොත්තු වෙති. එමඟින් මෙම ප්‍රිමාට සත්ත්ව කොට්ඨාසය පමණක් නොව පරිණාමීය ක්‍රියාවලිය සත්ත්වයන් හට කෙසේ බලපාන්නේ දැයි යන ගැටලුවට පිළිතුරු සෙවිමට ද කටයුතු කරනු ලබයි.

එමෙන් ම භෞතික මානව විද්‍යාඥයින් මිනිස් නොවන ප්‍රිමාටාවන් අධ්‍යයනය කිරීමට පෙළඹෙන්නේ ඔවුන් ස්වභාවයෙන් ම සිත් වශී කරන සත්ත්ව කණ්ඩායමක් වන නිසා ය. නමුත් නුතනයේ දී මිනිසාගේ අහිතකර ක්‍රියාවලින්ගේ ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන් ම වන විනාශය හා සත්ත්ව දඩයම හේතුවෙන් ප්‍රිමාටාවන් මරණයට පත්වීම සහ ඔවුන්ගේ වාසස්ථාන අහිමි වීම සිදුවේ. එහි ප්‍රතිඵලයක් ලෙස අද සිටින බොහෝ ප්‍රිමාටාවන් ලෝකයෙන් වඳ වීමේ තර්ජනයට ලක් වී ඇත. එම නිසා විධිමත් සංරක්ෂණ ක්‍රම භාවිතයෙන් ඔවුන් ආරක්ෂා කර ගැනීමට බොහෝ රටවල් උත්සාහ ගනිමින් සිටියි. මෙම ක්‍රියාවලිය සාර්ථක ව සිදු කරගෙන යාම සඳහා ප්‍රිමාටාවන්ගේ ජීව විද්‍යාත්මක ලක්ෂණ, සමාජීය චර්යා, ඔවුන්ගේ භෝජන ක්‍රම සහ වාසස්ථාන සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් තිබිය යුතු නිසා මොවුන් පිළිබඳ අධ්‍යයනයන කරයි. ඉහත සඳහන් කරන ලද කරුණු අරඹයා විද්‍යාඥයින් ප්‍රිමාටාවන් පිළිබඳ පර්යේෂණ සිදුකරන අතර ඔවුන් කරන මෙම අධ්‍යයනයන් මුලික කර ගනිමින් ප්‍රිමාටා විද්‍යා විෂයය ක්ෂේත්‍රය ව්‍යාප්ත ව ඇත.

**ප්‍රිමාටාවන් යනු**

ප්‍රිමාටාවන් යනුවෙන් සරල ව හඳුන්වන්නේ ක්ෂිරපායි වර්ගයේ එක් ගෝත්‍රයක් වන ප්‍රිමාට ගෝත්‍රයට අයත් සත්ත්ව කාණ්ඩයක් වේ. ලෝකයේ ප්‍රිමාටාවන් වර්ග 431ක් පමණ හඳුනාගෙන ඇති අතර මොවුන් ක්ෂිරපායින් අයත්වන Mammalia වර්ගයේ *Primates* ගෝත්‍රය යටතේ විද්‍යාත්මකව වර්ගීකරණය කර ඇත (රත්නායක; විදුසර).

සියලු සත්ත්වයින් අතර අග්‍රයින් නිසා මොවුන් අග්‍රේෂයින් ලෙස හඳුන්වන අතර දැනට ජිවත් ව සිටින අග්‍රේෂයින් ප්‍රධාන උපගෝත්‍ර දෙකක් යටතේ හඳුනාගත හැකි ය. එනම්,

1.Anthropods ( විශාල දේහ දරන්නන් හෙවත් විශාල මොළයක් සහිත වුවන්)

ජිවත් ව සිටින ඇන්ත්‍රොපොයිඩියාවන් ප්‍රධාන කාණ්ඩ තුනකට වර්ග කළ හැකි ය. එනම්,

- Cercopithicoids ( පැරණි ලොව වානරයන් - මැකක්, බැබුන්, ලැන්ගුර්)
- Ceboids ( නව ලොව වානරයන් - කැපුචින්, හවුලර්, මකුළු වඳුරන්)
- Plesiadapids ( වානරයන් - ගෝරිල්ලා, චිම්පන්සි, ඔරන් ඔටන් හා ගිබන්) වේ.

2. Prosimians ( කුඩා දේහ දරන්නන්)

මුල් ම ප්‍රිමාටාවන් වන මොවුන් ප්‍රධාන කොටස් තුනක් යටතේ හඳුනාගත හැකි ය. එනම්,

- උණහපුළුවන් ( Lorises-අප්‍රිකාව)
- ලීමරයන් (Lemurs-මැඩගස්කරය)
- ටාසියර් (Tarsiers-අග්නිදිග ආසියාව )

ශ්‍රී ලංකාවේ සිටින ප්‍රිමාටාවන් අතර ප්‍රධාන වශයෙන් රිළවා, කළු වඳුරා, හැලි වඳුරා සහ උණහපුළුවා යන විශේෂ හඳුනාගත හැකි ය. ඔවුන් සැම තැන ම එක සේ ව්‍යාප්ත වී නොමැති අතර ඔවුන්ගේ උප විශේෂ ලංකාවේ වෙනස් ප්‍රදේශවලට සීමා වී ඇත (එම).

මෙම ප්‍රිමාටාවන් අතරින් රිළවා සහ කළු වඳුරා ශ්‍රී ලංකාවට ආවේණික වේ. හැලි වඳුරා වියළි කලාපීය පරිසරය තුළ බහුලව දක්නට ලැබෙන අතර ශ්‍රී ලංකාවේ වෙසෙන එක ම නිශාචර ප්‍රිමාට විශේෂය ලෙස උණහපුළුවා හඳුනාගත හැකි ය.

**ප්‍රිමාටාවන් සතු ලක්ෂණ**

ක්ෂිරපායි ගණයට අයත් ප්‍රිමාටාවන් විශේෂ 4000කට පමණ අධික වේ. ප්‍රිමාටාවන්ගේ ගණය 1758 දී ලින්නේ විසින් නිර්මාණය කර ඇත. (නෙස්තුර්හ්; 1981; 34) ප්‍රිමාටාවන් බොහෝ දෙනෙකුට ආවේණික වු ගති ලක්ෂණ රාශියක් හඳුනාගත හැකි ය. එනම්,

- සාපේක්ෂ වශයෙන් විශාල මොළයක් තිබීම.
- නියපොතු සහ පරිග්‍රහණ ශක්තියක් ඇති ඇඟිලිවලින් යුත් අත් පා තිබීම.
- මාපට ඇඟිල්ල අතේ අනිකුත් ඇඟිලිවලට විරුද්ධ ව පිහිටා තිබීම.
- ඇස්වල ආරක්ෂාව සඳහා දෙපැත්තෙන් අස්ථිමය තැටි නැත්නම් අර්ධ කවාකාර අස්ථි පිහිටා තිබීම.
- විවිධ වර්ගවලට අයත් දත්, ආමාශයක් පපුවේ සස්තන ග්‍රන්ථි දෙක් ඇත.
- සමාජශීලි සතුන් වන අතර සංකීර්ණ චර්යා රටා පෙන්නුම් කරයි.
- ගැහැණු සහ පිරිමි සතුන් එකිනෙකට වෙනස් රූපාකාර පෙන්වයි.
- ප්‍රිමාටාවෝ බොහෝ අවස්ථාවල එක දරුවෙකු හෝ නැත්නම් දෙදෙනෙකු ප්‍රසූත කරනු ලබයි.

**මානවයාට සමගාමී ව ප්‍රිමාටාවන් තුළින් නිරූපණය වන ජෛවීය ලක්ෂණ**

විශ්වයේ ජීවය ජනිත වීම පිළිබඳ නිරවුල් අරුතක් නැතිමුත් අජීවී වස්තුන්ගෙන් ජීවී වස්තුන් වෙන් කර ගැනීමෙහිලා ලක්ෂණ කිහිපයක් භාවිත කරයි. ජෛවීය ලක්ෂණ නම් වූ මේවා අතර වර්ධනය, ස්වසනය, සංචරණය, ප්‍රජනනය, අනුවර්තනය, පිළිවෙළ හා සංවිධානය, උත්තේජවලට ප්‍රතිචාර දැක්වීම, ආවේණිය සහ පරිණාමය ආදි ලක්ෂණ විශේෂ වේ. මානව පරිණාමයේ මූල බීජය සෙවීමේ දී පර්යේෂකයන් නූතන අග්‍රේෂයන් සහ මානවයා අතර ඇති කායික සහ චර්යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීමට යොමු වී තිබේ. මෙවැනි අධ්‍යයනයන් තුළින් වර්තමානයේ ජීවත් වන මිනිස් නො වන ප්‍රිමාටාවන්ගේ භෝජන ක්‍රම, සමාජ චර්යා රටා සහ ව්‍යූහ විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනයට යොමු වීම තුළින් ආදියේ විසූ ප්‍රිමාටාවන්ගේ සහ ආදී මානවයන්ගේ චර්යා රටාවන් නැවත ගොඩනැංවීමට උත්සාහ දරයි.

මෙහි දී හැලි වඳුරු කණ්ඩායමකගේ දෛනික චර්යා රටාව අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත් දත්තයන් අනුව මානවයාට සමාගාමී ව මොවුන් තුළින් නිරූපණය වන ජෛවීය ලක්ෂණයන් අධ්‍යයනය කරන ලදි. මිනිසාට මෙන් හැඟම් ප්‍රකාශයට දියුණු භාෂාවක්, ඇදහැලි විශ්වාස හා චින්තන ක්‍රම නො තිබුණත් ඔවුන්ගේ හැසිරීම් තුළින් නිරූපණය වන බොහෝ කරුණු මානවයා හා සමතාවක් ගන්නා බව පැහැදිලි විය. එමගින් ප්‍රිමාටාවන් තුළින් ආදි මානව චර්යා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.

ඉහත දැක් වූ ජෛවීය ලක්ෂණ මිනිසා ප්‍රමුඛ කොට ගත් සෑම සත්ත්ව කොට්ඨාසයකට ම පොදු ලක්ෂණයන් වේ. හඳුනාගත් චර්යාවන් සමඟ එක් එක් ලක්ෂණයන් හැලි වඳුරන් තුළින් නිරූපණය වූ ආකාරය පහත කරුණු ඔස්සේ ලඝු කොට දැක්විය හැකි ය.

**ආරක්ෂාව**

මිනිසා හා සමීප ඥාතිත්වයක් පිළිබිඹු කරන හැලි වඳුරන් තම ආරක්ෂාව උදෙසා ආක්‍රමණික ස්වරූපයන් පෙන්නුම් කරයි. රංචු වශයෙන් හෝ ජෝඩු වශයෙන් ගැවසීමේ දී මනා නායකත්වය ලක්ෂණවලින් පරිපූර්ණ කණ්ඩායම් ප්‍රධානියා ඇතුළු සෙසු පිරිස කණ්ඩායමේ ආරක්ෂා ව පිළිබඳ ව නිතර ම විමසිලිමත් වෙයි. යම් අනතුරක සේයාවක් පෙනුණහොත් කණ්ඩායමට පරිබාහිර ව සිට එය පාලනයට තරම් ජවයක් කණ්ඩායම් නායකයා තුළ ඇත. මානව සමාජය තුළ නායකයෙකු තම පවුලේ, කණ්ඩායමේ හෝ ආයතනයේ ආරක්ෂාව පතා ක්‍රියා කරන්නේ යම් සේ ද එවැනි ලක්ෂණ මෙම සත්ත්ව කණ්ඩායමේ නායකයා තුළින් මනාව නිරූපණය වේ.

අනතුරකට ගොදුරු වුවෙකු ලබා දෙන කෙටි සංඥාවකින් වුව ද ස්වකීය කණ්ඩායමේ සිටින සියලු සාමාජිකයන් පැමිණ ආරක්ෂාව සපයයි. හැලි වඳුරු සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ කණ්ඩායම තුළින් ස්ත්‍රිය ප්‍රමුඛ වූ සමාජ රටාවක් නිර්මාණය වී තිබීමයි. කණ්ඩායම් ආරක්ෂා ව සඳහා සටන් වදින සෑම අවස්ථාවක ම කාන්තා පාර්ශවය ප්‍රමුඛත්වයක් ගන්නා අතර තරමක් ආක්‍රමණශීලි වූ වැඳිරියන් තම කණ්ඩායමට එල්ල වන අභියෝග පළවා හරිමින් ඔවුන්ගේ ආරක්ෂාව සළසා ගැනිමට කටයුතු කරයි.

මෙවැනි කරුණු තුළින් පැහැදිලි වන්නේ මිනිස් සමාජය තුළ මෙන් ම තම පවුලේ ආරක්ෂාව, කණ්ඩායමේ ආරක්ෂාව සහ ස්වකීය වර්ගයාගේ ආරක්ෂා ව නිබඳ ව ම මොවුන් ද අපේක්ෂා කරන බවයි. මිනිසා තරම් දියුණු සංස්කෘතියක් නො තිබුණත් ප්‍රිමාටාවන් තුළින් හඳුනාගත හැකි මෙවැනි ලක්ෂණයන් පරිණාමීය ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස මානවයාට දායාද වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

**දරුවන් ආරක්ෂා කරගැනිම**

මව්පිය දූදරු සෙනෙහසට සීමා මායිම් නැත. වඳුරු මව්වරුන්, මිනිස් මව්වරුන් මෙන් ම තම දරුවා ඇකයෙහි හොවාගෙන කිරි පොවා පෝෂණය කරයි. දරුවන්ගේ හිස අතගායි. ආදරයෙන් සිප වැළඳ ගනියි. සෑම මවකගේ මෙන් ම මොවුන්ගේ ද දරු සෙනෙහස උතුරා යාමේ දී මතුවන හැඟීම් සමුදාය ඇයගේ මුහුණෙන් මනාව පිළිබිඹු වේ. කුසට ආහරක් නොමැති ව නෙතට නින්දක් නැති ව රෑ දිවා නොබලා දරුවන් රැක බලා ගැනීමට මව්පියන් වෙහෙස වන්නේ යම් සේ ද ඊට සමාන ආකාරයෙන් ම ආදරයේ අඩුවක් නො දැනෙන්න වඳුරු මව්පියන් දරුවන් ආරක්ෂා කරයි. මෙලොව එළිය දුටු කිරිකැටි දරුවන් මවගේ උණුසුමට ගුලිවන්නා සේ ම කුඩා වඳුරු පැටවුන් නිතර ම මවගේ උණුසුම සොයයි. මවගේ තුරුලට වී කිරි උරා බොන කුඩා පැටවා දෙස ආදරයෙන් බලා සිටින පියා ඔවුන් ආසන්නයේ ම සිටිමින් ආරක්ෂාව සපයයි. හය හතර නො දත් කිරිකැටියා ඇවිදීමට උත්සාහ කරන විට මව්පියන් ආදරයෙන් ඒ දෙස බලා සිටියි. ඇතැම් අවස්ථාවල කුඩා වඳුරු පැටවුන් දෙමාපිය අවධානය යොමු කර ගැනීම සඳහා කුඩා දරුවන් මෙන් ම කෑ ගසනු ලබයි.

තරමක් වැඩිවියට පත් වඳුරු පැටවුන් තුළින් දඟකාරි ස්වරූපයක් ඉස්මතු වේ. ඔවුන් හැකි සෑම අවස්ථාවක ම මව් තුරුලෙන් මිදි ගොස් සෙල්ලම් කරයි. පොර බදිමින් එකිනෙකා පසුපස දිව යන අතර පඳුරු අතරින් පැන ගස්වලට නඟී. මේ සියලු ක්‍රියාකාරකම් මිනිස් දරුවන්ගේ ලෝකය තුළ තිබෙන ක්‍රියාකාරකම්වලට බොහෝ සෙයින් සමාන වේ. තම තුරුලෙන් මිදී යන සෑම අවස්ථාවක ම දරුවා ගැන විමසිල්ලෙන් පසුවීමට මව හෝ පියා වග බලා ගනි.

මව් සෙනෙහසේ මෙකී අරුමය පහත සඳහන් වඳුරු මවකගේ දාරක ප්‍රේමය නම් වූ නිසඳැස තුළින් පසක් කර ගත හැකි වේ.

> "බල්ලන් විසින් ලුහුබඳින ලද වැඳිරියක් තම
>
> අත දරු පැටවා ත් සමඟ කුඹුරක් මැද තිබුණු
>
> තනි ගසකට නැඟ ගත්තා ය. බල්ලෝ ගස වටේ
>
> සිට ගත්හ. එතැනින් කැලෑවට පැනගොස්
>
> ගැළවෙන්නට ඉඩක් නැති බැව් දත් වැඳිරිය
>
> තම පැටවා අත්තක් උඩ තබා මොකක් දෝ

පැටවාට කියා ගස මුල බුරමින් සිටි බල්ලන්

මතට පැන්නා ය. ඇසිල්ලක දී ඇය බල්ලන්

විසින් කැබලි කැබලිවලට ඉරා දමනු ලැබිණි."

බ්‍රසීලයේ හව්ලර් (හූ වඳුරු) වර්ගයට අයත් වැඳිරියක සහ ඇගේ පැටවා පිළිබඳව ය (විජේවික්‍රම; 2007).

මානව සංස්කෘතිය තුළ මිනිසා දරුවන්ගේ ආරක්ෂාව සහ දියුණුව අපේක්ෂාවෙන් සියලු දෙය කැප කරමින් ක්‍රියාකරන්නා සේ ඒ හා සමාන ක්‍රියාවලියක් හැලි වඳුරන්ගේ හැසිරීම් රටාව තුළින් ද නිරූපණය වේ.

**නායකත්වය**

මානව සංස්කෘතිය තුළ උද්දීපනය වන නායකත්ව ලක්ෂණ මෙම සත්ත්ව විශේෂය තුළින් ද පැහැදිලි ව හඳුනාගත හැකි ය. සෑම සත්ත්ව කොට්ඨාසයක් ම රංචු වශයෙන් හෝ ජෝඩු වශයෙන් දක්නට ලැබේ. රංචු වශයෙන් ජීවත්වන සෑම සත්ත්වයෙකුට ම නායකත්වයේ අවශ්‍යතාව පවති. සෑම සත්ත්ව කණ්ඩායමක් තුළ ම තම වර්ගයාට ආරක්ෂා ව රැකවරණය ලබා දෙන නායකයෙකු සිටී. ශක්තිමත් බල සම්පන්න හැඩි දැඩි පෞරුෂත්වයකින් හෙබි වඳුරෙකු, නායකයා ලෙස පත් කරගෙන තිබේ. මිනිස් සමාජය තුළ මෙන් ම වඳුරන් අතර ද තම කණ්ඩායමට නායකයෙකු පත් කර ගැනීමේ දී බල අරගලයක් පවතින අතර ඇතැම් අවස්ථාවල ජීවිත හානි පවා මෙහි දී සිදු විය හැකි ය.

නායකත්වය තුළින් මෙහෙය වනු ලබන ඕනෑ ම ආයතනයක මෙන් ම සත්ත්ව කණ්ඩායමක ද පැවැත්ම රඳා පවතින්නේ නායකයාගේ ක්‍රියා කලාපය අනුව ය. නායකයා මනා පෞරුෂත්වයකින් යුතු ව තම කණ්ඩායමේ යහපත උදෙසා ක්‍රියා කරන්නේ නම් ඔවුන් හට එල්ල වන අභියෝගයන් පහසුවෙන් ජය ගැනීමට හැකි බව මොවුන්ගේ ක්‍රියා කලාපය අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ "උත්සාහවන්තයා ජය ගනී" යන වියත් කියමන ද මතකයට එක් කරමිනි.

**කණ්ඩායම තුළින් නිරූපණය වන අන්‍යෝන්‍ය සහයෝගිත්වය**

ප්‍රිමාටාවන් අතරින් අන්‍යෝන්‍ය සහයෝගිත්වය උපරිම අයුරින් නිරූපණය වන සත්ත්ව කොට්ඨාසයක් ලෙස හැලි වඳුරන් හඳුනාගත හැකි ය. මොවුන් කණ්ඩායමක් ලෙස දක්නට ලැබෙන අතර එකිනෙකාට උදව් කර ගනිමින් සහයෝගී ව කටයුතු කරයි.

විශ්වවිද්‍යාල භූමියේ සිටින හැලි වඳුරන් තුළින් දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් ලෙස එකිනෙකා සහයෝගයෙන් ශරීර පිරිසිදු කර ගන්නා ආකාරය පෙන්වා දිය හැකි ය. ශරීරය පිරිසිදු කර ගැනීමේ කාර්යය වඩා පහසු කරගැනීම සඳහා කණ්ඩායමේ සිටින අනෙකුත් සාමාජිකයන්ගෙන් සහය ලබා ගැනීමට මොවුන් කටයුතු කරයි.

කණ්ඩායමට එල්ලවන අභියෝග හමුවේ කණ්ඩායමේ සියලු සමාජිකයන් සහයෝගයෙන් ක්‍රියා කරයි. ඕනෑ ම සාමාජිකයෙකු හට අනතුරක් සිදු වු විට ඔහු තනිකර යාමේ කුහක ගති මෙම සත්ත්ව කොට්ඨාසය තුළ දක්නට නොලැබීම ඔවුන් අතරින් නිරූපණයවන විශේෂ ගුණාංගයක් ලෙස පෙන්වා දිය හැකි ය.

කාලයාගේ වැලි තලාවෙන් යටපත් වී ඇති මිනිසුන් අතර නොමැති උසස් ගතිගුණ, ඇතැම් අවස්ථාවල දි මෙම සතුන්ගේ චර්යාවන්හි ගැබ් ව තිබෙන බව ඉහත සඳහන් කරුණු තුළින් පැහැදිලි වේ.

**කණ්ඩායමෙන් පිටත අනෙකුත් සත්ත්වයන් සමඟ පවත්වන සහයෝගිතාව**

රජරට විශ්වවිද්‍යාල භූමිය තුළ සිටින හැලි වඳුරන් කණ්ඩායම සහ රිළවුන් කණ්ඩායම කළහා කර ගැනිමකින් තොර ව එකිනෙකාට උදව් කර අන්‍යෝන්‍ය සහයෝගීත්වයෙන් ජිවත් වේ. ජාති භේද වශයෙන් කුලල් කා ගන්නා මිනිස් සමාජයක මෙම ප්‍රිමාටා සත්ත්ව කොට්ඨාසයන් දෙකෙහි පවතින අන්‍යෝන්‍ය සහයෝගිත්වය ආදර්ශයක් වේ. මෙම සත්ත්ව කොට්ඨාස දෙක අතර පවතින අන්‍යෝන්‍ය සහයෝගිත්වය ඉස්මතු වි පෙනෙන අවස්ථාවක් ලෙස රිළවුන් වඳුරන්ගේ උකුණන් බැලීමට දක්වන රුචිය පෙන්වා දිය හැකි ය.

**නිගමනය**

මානවයාගේ අතීතය සොයා යන පුරාවිද්‍යා විෂය ධාරාව තුළ සිදු කරන ප්‍රධාන ක්‍රියාවලිය ලෙස ද්‍රව්‍යාත්මක අවශේෂ මත පදනම් ව අතීත මිනිසා යළි ප්‍රතිනිර්මාණය කිරිම පෙන්වා දිය හැකි ය. හැලි වඳුරන්ගේ හැසිරීම් රටා ව පිළිබඳ කරන ලද අධ්‍යයනය තුළින් මානවයාට සමගාමී ව ඔවුන් සතු ජෛවීය ලක්ෂණ කෙතරම් සමීපත්වයක් දක්වන්නේ ද යන්න පිළිබඳ පැහැදිලි කර ගැනිමට හැකි විය.

කුඩා දරුවෙකු මවගේ උණුසුමට ගුලිව සිටින අවස්ථාවක දරුවා පැත්තකින් තබා මව ඉවත් වු විට දරුවා අඬන්නේ කෙසේ ද වඳුරු පැටවුන් ද එවැනි අවස්ථාවකට මුහුණ දුන් විට මෙම ක්‍රියාවලිය ම සිදු කර නැවත මව තමා ළඟට ගෙන්වා ගැනිමට කටයුතු කරයි. ස්වභාව ධර්මයේ නිර්මිතයන් කෙතරම් විශ්මය ජනක ද යන්න මෙවැනි දෙය නිරික්ෂණය කිරිමෙන් අප හදවතට ද දැනේ. මිනිසාට මෙන් හැඟිම් ප්‍රකාශ කිරිමට තරම් දියුණු භාෂාවක්, සංස්කෘතියක් මෙම සත්ත්ව විශේෂයට නොතිබුණත් අනිකුත් බොහෝ ලක්ෂණ මානව චර්යාවන් හා සමාන බව නිගමනය කළ හැකි ය.

හැලි වඳුරන්ගේ හැසිරීම් රටාව අධ්‍යයනය කරන විට අප කාටත් පැන නඟින ප්‍රධාන ගැටලුව වන්නේ මිනිසාගෙන් මෙම ජෛවීය ලක්ෂණ ප්‍රිමාටා සත්ත්වයන් ඉගෙන ගත්තා ද නැතිනම් ප්‍රිමාටාවන්ගෙන් මිනිසාට මෙම ලක්ෂණ උරුම වුවා ද යන්නයි. මේ සඳහා පැහැදිලි පිළිතුරක් එංගලන්ත ජාතික චාල්ස් ඩාවින් ඉදිරිපත් කළ අතර පරිණාම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස වත්මන් මිනිසා නිර්මාණය වි තිබෙන බව ඔහු පෙන්වා දි තිබේ. මේ අනුව ප්‍රිමාටාවන් තුළ දක්නට ලැබෙන චර්යා මිනිසා තුළින් ද යම් යම් අවස්ථාවල දි ඒ ආකාරයෙන් ම හඳුනාගත හැකි වුව ත් වානර සමාජ තුළ තිබුණු බොහෝ චර්යා රටාවන් මානව චින්තනයේ දියුණුවත්

සමඟ ශිෂ්ටත්වයට පත් වී තිබෙන ආකාරය මානව ගති ලක්ෂණ හා හැලි වඳුරන්ගේ ජෛවීය ලක්ෂණ පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක් කිරීමෙන් තහවුරු කරගත හැකි විය. මෙවැනි අධ්‍යයනයන් තුළින් ආදි මානව සමාජය නැවත ගොඩනැංවීමේ කාර්යයේ දී ඔවුන්ගේ චර්යා රටාවන් පිළිබඳ උපකල්පනයන් ඉදිරිපත් කිරීමේ අවකාශය ද ඇති වේ.

එමෙන් ම ශ්‍රී ලංකාවේ ප්‍රිමාටාවන් සම්බන්ධ පර්යේෂණ තවමත් ප්‍රාථමික අවස්ථාවේ පවති. අන් රටවල් හා සසඳන විට සිදු කරන පර්යේෂණ සංඛ්‍යාව ද ස්වල්ප වන අතර ඒවා ක්ෂේත්‍ර පර්යේෂණයන්ට පමණක් සීමා වී ඇත. එම නිසා මෙවැනි ප්‍රිමාට අධ්‍යයනයන් ශ්‍රී ලංකාවේ සිදු කිරීම තුළ දේශීය වශයෙන් ප්‍රිමාට විද්‍යාවේ අභිවෘද්ධිය උදෙසා ද දායකත්වයක් ලබා දීමට හැකි වේ.

## ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය


උඩවත්ත, ඒ, 2004, ***මානව පරිණාමය;*** වාසනා ප්‍රකාශකයෝ, දන්කොටුව.

කුමාර, එන්. වී. ජී. එච්, ***සමාජ විද්‍යාව හා මානවවිද්‍යාව ප්‍රවේශයඃ*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

ගුණවර්ධන, පී, ගාමිණී ඒ, 2009, ***මානව විද්‍යාව හැඳින්වීම;*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

ගුණසේකර, එස්, 1998, ***සමාජ විද්‍යාව***, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 217, ඕල්කොට් මාවත, කොළඹ 11.

නේස්තුර්ත්, එම්, 1981, ***මිනිසාගේ සම්භවය;*** (පරි.) දැ. වී. රුද්රිගු, ප්‍රගති ප්‍රකාශන මන්දිරය, මොස්කව්.

මොරිස්, ඩී, 1978, ***නිරුවත් වානරයා;*** (පරි.) එස්. එම්. බන්දුසීල, නව විද්‍යා ප්‍රකාශන, නුගේගොඩ.

රත්නපාල, එන්, 1986, ***සමාජ විද්‍යාවේ මූලධර්මඃ*** සීමා සහිත ස්ටැම්ෆර්ඩ් ලේක් (පුද්ගලික) සමාගම, 366, හයිලෙවල් පාර, පන්නිපිටිය.

රත්නපාල, එන්, 2001, ***මානවවිද්‍යාව;*** ආරිය ප්‍රකාශකයෝ, බෞද්ධ විද්‍යාල මාවත, වරකාපොළ.

විජේවික්‍රම, ජේ, 2002, ***චිම්පන්සියා අපේ ම කෙනෙක්;*** ගංගොඩවිල, නුගේගොඩ.

විජේවික්‍රම, ජේ, 2007, ***මිනිස් පරපුරේ වඳුරෝ;*** 48/7, කැස්බෑව පාර, නුගේගොඩ.

රත්නායක, ඒ, 1999, ***සමාජවිද්‍යා මානවවිද්‍යා න්‍යාය***, කර්තෘ ප්‍රකාශනයකි.

සෙනෙවිරත්න, ඒ, 1971, ***සංස්කෘතිය හා සමාජය;*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

Korovkin, F, 2003, ***මිනිස් ඉතිහාසයේ කතන්දරය,*** (පරි.) සුගත් කංකානම්ගේ, කර්තෘ ප්‍රකාශනයකි.

http://ec.europa.eu/health/scientific_committees/opinions_layman/en/non-human-primates/index.htm, 2015.07.20

https://en.wikipedia.org/wiki/Animal_testing_on_non-human_primates, 2015.07.25

https://en.wikipedia.org/wiki/Great_ape_research_ban, 2015.08.10

http://www.the-aps.org/ChimpResearch,2015.08.10